267703

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

5

**EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, AUGUST 2019**

## පාසල්වලට සිසුන් තෝරාගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2019 අගෝස්තු

# I පත්‍රය

**මිනිත්තු 45 යි.**

විභාග අංකය ....................................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:**

* ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත ලියන්න.**
* **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **40**ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු **තුන** බැගින් දී ඇත. ඒවා අතුරෙන්, එක් එක් ප්‍රශ්නයට අදාළ **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.**
* කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**


| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| **අවසාන ලකුණ** | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමුවන පරීක්ෂක** ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක** පළමුවන පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක** ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක** අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය. | V/I/S/CH |

(දෙවැනි පිටුව බලන්න


● අංක **1** සහ **2** ප්‍රශ්නවල කොටුව තුළ ඇති කාණ්ඩයට ඇතුළත් කිරීමට වඩාත් ගැළපෙන රූපය තෝරන්න.

**1.**



(1)  (2)  (3) 


**2.**



(1)  (2)  (3) 

● අංක **3** සහ **4** ප්‍රශ්නවල දී ඇති රූප නිරීක්ෂණය කර පිළිතුරු සපයන්න.

**3.**



A රූපය




B රූපය


A හා B රූප දෙක අතර ඇති වෙනස්කම් ගණන කීය ද?

(1) 1 (2) 2 (3) 3

**4.**



C රූපය




D රූපය


C හා D රූප දෙක අතර ඇති වෙනස්කම් ගණන


(1) හතරට අඩු ය. (2) හතරකි. (3) හතරට වැඩි ය.


**5.** පහත දැක්වෙන රටාව ඉදිරියට සම්පූර්ණ කිරීමේදී හයවැනි තැනට තැබිය යුතු කාඩ්පත කුමක් ද?



1 2 3 4 5 ...?... 6

 (1)

 (2)


 (3)

Department of Examinations - Sri Lanka


(තුන්වැනි පිටුව බලන්න

විභාග අංකය: ...............................

**6.** පහත දී ඇති රූපවල ඉරටු කැබලි තුන බැගින් ඇත.
ඒවායේ මුළු දිග ඒ අයුරින්ම භාවිත කර ත්‍රිකෝණයක් සැකසිය හැකි ඉරටු කැබලි ඇති රූපය කුමක් ද?


(1)


(2)


(3)


**7.** මෙම ප්‍රශ්න පත්‍රයේ මුල් පිටුවෙහි දී ඇති තොරතුරුවලට අනුව නිවැරදි ප්‍රකාශය කුමක් ද?


(1) විභාග අංකය ස්ථාන දෙකක ලිවිය යුතු අතර පිළිතුරු සැපයීමට ලබාදෙන කාලය පැයකට අඩු ය.

(2) විභාග අංකය ස්ථාන දෙකක ලිවිය යුතු අතර පිළිතුරු සැපයීමට ලබාදෙන කාලය පැයකට වැඩි ය.


(3) විභාග අංකය ස්ථාන තුනක ලිවිය යුතු අතර පිළිතුරු සැපයීමට ලබාදෙන කාලය පැයකට අඩු ය.

**8.** පොතක පිටු දෙකක අකුරු යම් ආකාරයකට යොදා ඇති අයුරු රූපයේ දැක්වේ.
එය හඳුනාගෙන ඒ අනුව ම අකුරු යොදා ඇති පිටු දැක්වෙන රූපය තෝරන්න.




(1)



(2)



(3)

● පහත කවිය කියවා, අංක **9** සහ **10** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පොත් කියවන සැම දෙනා
නව දැනුමෙන් පිබිදෙනා
අලුත් අලුත් දේ තනා
ලොව බැබළෙයි තරු මෙනා

**9.** මෙම කවියේ **සමස්ත** අදහසින් පැවසෙන්නේ,

(1) පොත් කියවීමේ අගය පිළිබඳව ය.

(2) තරු ලොවේ බැබළීම පිළිබඳව ය.

(3) අලුත් අලුත් දේ නිර්මාණය පිළිබඳව ය.

**10.** කවියෙහි දැක්වෙන අදහස් කිහිපයක් නිවැරදි අනුපිළිවෙළින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) අලුත් දැනුම ලබා ගැනීම ⟶ පොත් කියවීම ⟶ අලුත් අලුත් දේ නිර්මාණය කිරීම

(2) පොත් කියවීම ⟶ අලුත් අලුත් දේ නිර්මාණය කිරීම ⟶ අලුත් දැනුම ලබා ගැනීම

(3) පොත් කියවීම ⟶ අලුත් දැනුම ලබා ගැනීම ⟶ අලුත් අලුත් දේ නිර්මාණය කිරීම

**11.** අඳුරෙදි නැති - එළියෙදි ඇති
මට ම හිතැති - මගේ ම සකි
මෙයින් කියැවෙන්නේ,

(1) හිතමිතුරා ගැන ය. (2) සෙවනැල්ල ගැන ය. (3) හිරු ගැන ය.

Department of Examinations - Sri Lanka

(හතරවැනි පිටුව බලන්න

● පහත දැක්වෙන්නේ කතන්දරයක කොටසකි. එහි හිස්තැන්වලට ගැළපෙන වචන ඇතුළත් කොටස තෝරන්න.

**12.** පැණි කුරුල්ලා සහ මී මැස්සා කැලේ සිටිය අඹ යහළුවෝ දෙන්නෙක්. දවසක් ගඟ ළඟ ...... අත්තක් උඩ සිටි පැණි කුරුල්ලා දැක්කා යාළුවා වතුරේ ගසාගෙන යන බව. ...... ඉක්මනට හොටෙන් ගසේ කොළයක් කඩා ගත්තා. එය මී මැස්සා ළඟට දැම්මා. ...... වතුරට දැමූ කොළය මතට ගොඩවුණා. තටු වේලාගෙන ටික වෙලාවකින් ඉගිල ගියා.

(1) ගසක / මී මැස්සා / පැණි කුරුල්ලා

(2) ඉවුරේ / පැණි කුරුල්ලා / මී මැස්සා

(3) ගසක / පැණි කුරුල්ලා / මී මැස්සා

● පහත දැක්වෙන සටහන බලන්න.

| | පළමුවන තීරය | දෙවන තීරය | තුන්වන තීරය |
|---|---|---|---|
| පළමුවන පේළිය | A | B | C |
| දෙවන පේළිය | F | E | D |
| තුන්වන පේළිය | G | H | I |

Department of Examinations - Sri Lanka

පියවර 1 හි හා 2 හි සඳහන් ආකාරයට සටහන වෙනස් කරනු ලැබේ. ඒ ඇසුරින් අංක **13** සහ **14** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පියවර 1 - පළමුවන පේළිය තිබෙන තැනට දෙවන පේළියත් දෙවන පේළිය තිබූ තැනට පළමුවන පේළියත් මාරු කිරීම

පියවර 2 - දෙවන තීරය තිබෙන තැනට තුන්වන තීරයත් තුන්වන තීරය තිබූ තැනට දෙවන තීරයත් මාරු කිරීම


**13.** වෙනස් කිරීම්වලින් පසු රූපයේ මැද කොටුවේ පිහිටන අකුර කුමක් ද?

(1) B (2) C (3) D

**14.** මුල් රූපයේ I අකුර තිබූ තැනට වෙනස් කිරීම්වලින් පසු පැමිණි අකුර කුමක් ද?

(1) H (2) G (3) D

**15.** රූපයේ හිස්තැනට ගැළපෙන කොටස තෝරන්න.



(1) (2) (3)

**16.** ✱ සංකේතය දෙවරක් ද ☆ සංකේතය එක්වරක් ද යොදාගෙන 343 යන සංඛ්‍යාව ලියා තිබුණි. 343ට 100 ක් එකතු කළ විට ලැබෙන සංඛ්‍යාව දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) ✱ ✱ ☆ (2) ☆ ☆ ✱ (3) ☆ ✱ ☆


**17.** A කඩදාසි පටිය | △ | ○ | # | □ |  B කඩදාසි පටිය | ⊕ | ✡ |



A කඩදාසි පටියෙහි ඇති # සලකුණ මත B කඩදාසි පටියෙහි ඇති ✡ සලකුණ පිහිටන සේ A කඩදාසි පටිය මත B කඩදාසි පටිය තැබූ විට දැකිය හැකි රූපය කුමක් ද?

(1) | △ | ⊕ | ✡ | □ | (2) | △ | ○ | ✡ | □ | (3) | ⊕ | ✡ | # | □ |


- අංක **18** සහ **19** ප්‍රශ්නවල හිස් කොටුවට ගැළපෙන රූපය තෝරන්න.

**18.**



(1)  (2)  (3) 

**19.**



(1)  (2)  (3) 

**20.** සුනිල් ඉනිමඟක හතරවන ලී පටිය මත සිටියි. තව ලී පටි තුනක් ඉහළට නැග්ග විට ඔහුට ඉනිමගේ හරි මැද ලී පටිය මතට පැමිණිය හැකි ය. ඉනිමගේ ඇති මුළු ලී පටි ගණන කීය ද?

(1) 10 (2) 13 (3) 14

**21.** ළමයෙක් තවත් ළමයින් හතරදෙනකු ගඟකින් එගොඩට ගෙන ගොස් ඔවුන් සියලු දෙනා ම එහි සිටි ළමයා ළඟ නතර කර, නැවත මෙගොඩට පැමිණ තවත් ළමයින් තිදෙනකු සමග එගොඩ සිටි ළමයින් ළඟට ගියේ ය. දැන් එගොඩ සිටින මුළු ළමයින් සංඛ්‍යාව කීය ද?

(1) 7 (2) 8 (3) 9

**22.** නිමල් උපදින විට ඔහුගේ මවගේ වයස අවුරුදු 25 කි. නිමල්ගේ මල්ලී උපදින විට මවගේ වයස අවුරුදු 29 කි. නිමල්ගේ දැන් වයස අවුරුදු 10 නම් ඔහුගේ මල්ලීගේ දැන් වයස අවුරුදු කීය ද?


(1) 4 (2) 5 (3) 6

**23.** "දින පහ ම පාසල පැවැත් වූ සතියක එක ළඟ දින තුනක් ම සමන්ට පාසල් පැමිණීමට නොහැකි විය." මෙම ප්‍රකාශය අනුව සමන් නිසැකව ම පාසල් **නොපැමිණි** දවස වනුයේ,

(1) බදාදා ය. (2) බ්‍රහස්පතින්දා ය. (3) සිකුරාදා ය.


(හයවැනි පිටුව බලන්න

Department of Examinations - Sri Lanka

**24.** 

මෙම රූපය තද ඉරි දිගේ ● සලකුණු පිටතට සිටින සේ නමා චතුස්තලයක් සාදා ගන්නා ලදී. එම චතුස්තලය දැක්වෙන රූපය තෝරන්න.

(1)  (2)  (3) 


**25.** 

මෙම රූපයෙහි දැකිය හැකි සමචතුරස්‍ර සංඛ්‍යාව කීය ද?

(1) 2 (2) 8 (3) 10

**26.** පුද්ගලයින් තිදෙනකුගේ නම් ඉංග්‍රීසි අකුරු යොදා සංකේතාත්මකව BEAT, NEAT සහ SEAT ලෙස ලියා තිබුණි. මොවුන් තිදෙනාගේ නම් නිවැරදිව ලියා ඇති පිළිතුර කුමක් ද?

(1) සුනිමල්, සිරිමල්, දුනිමල් (2) ධනපාල, ඥානපාල, දිනපාල (3) පියසිරි, ජයසිරි, දයාසිරි


**27.** 

රූපයේ දැක්වෙන තරාදි සමබරව පවතී. ඒ අනුව ■ ට සමාන වනුයේ,

(1) ▲● (2) ▲▲ (3) ▲▲●

**28.** A රූපය තුළ B රූපයේ හැඩයේ විවිධ පිහිටීම් කීයක් දැකිය හැකි ද?

A රූපය



B රූපය



(1) 6 (2) 3 (3) 1

**29.** දැනුම මිනුම තරගයකදී ප්‍රශ්න පහක් ලැබේ. පළමුවන ප්‍රශ්නයට ලකුණු 1 ක් ද දෙවන ප්‍රශ්නයට ලකුණු 2 ක් ද තුන්වන ප්‍රශ්නයට ලකුණු 3 ක් ද හතරවන ප්‍රශ්නයට ලකුණු 4 ක් ද පස්වන ප්‍රශ්නයට ලකුණු 5 ක් ද පිරිනැමේ. ලකුණු 13 ක් ලබාගත් ශිෂ්‍යයකුට නිවැරදිව පිළිතුරු සැපයීමට **නොහැකි** වූයේ කීවෙනි ප්‍රශ්නයට ද?

(1) පළමුවන (2) දෙවන (3) තුන්වන

**30.** "මට ඉන්නේ අයියා කෙනෙකුයි අක්කා කෙනෙකුයි විතරයි. අපේ අම්මාට පුතෙකුයි දුවලා දෙන්නෙකුයි ඉන්නවා." යනුවෙන් ළමයෙක් ප්‍රකාශ කරයි.

ඒ අනුව, මෙම ළමයා එම පවුලේ

(1) වැඩිමහල් දියණිය වේ.


(2) බාල දියණිය වේ.

(3) බාල පුතණුවන් වේ.

Department of Examinations - Sri Lanka

(හත්වැනි පිටුව බලන්න

**31.** සතුන්, පක්ෂීන්, මයිනා සහ හාවා අතර සම්බන්ධතාව පහත රූපයෙන් දැක්වේ.



◯ මගින් නිරූපණය වන්නේ,

(1) හාවා ය. (2) මයිනා ය. (3) පක්ෂීන් ය.

**32.** සිද්ධියක අවස්ථා තුනක් නිවැරදි අනුපිළිවෙළින් ලියා ඇති ආකාරය දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) තේරුම් ගනියි ⟶ පාඩම කියවයි ⟶ පැහැදිලි කරයි

(2) දොර වසයි ⟶ අගුල දමයි ⟶ නින්දට යයි

(3) සුළඟ හමයි ⟶ සිසිල දැනෙයි ⟶ උණුසුම අඩු වෙයි

**33.** වත්තක ඇති අඹ, පේර හා රඹුටන් ගස් සංඛ්‍යාව එකිනෙකට සමාන ය. එහි ඇති පොල් ගස් සංඛ්‍යාව අඹ, පේර හා රඹුටන් ගස් සංඛ්‍යාවේ එකතුවට සමාන ය. එම තොරතුරු ප්‍රමාණාත්මකව දක්වා ඇති සටහන තෝරන්න.

<table>
<tr><td>පොල්</td><td>රඹුටන්</td></tr>
<tr><td>පේර</td><td>අඹ</td></tr>
</table>

(1)

<table>
<tr><td>අඹ</td><td>පේර</td><td>රඹුටන්</td></tr>
<tr><td colspan="3">පොල්</td></tr>
</table>

(2)

<table>
<tr><td colspan="3">පොල්</td></tr>
<tr><td>අඹ</td><td>පේර</td><td>රඹුටන්</td></tr>
</table>

(3)

**34.** පන්තියක සිටින ගැහැනු ළමයින් සංඛ්‍යාවේ හා පිරිමි ළමයින් සංඛ්‍යාවේ එකතුව එම පන්තියේ සිටින පිරිමි ළමයින් සංඛ්‍යාව මෙන් දෙගුණයකි. මේ අනුව නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) පිරිමි ළමයින් සංඛ්‍යාවට වඩා ගැහැනු ළමයින් සංඛ්‍යාව වැඩි ය.


(2) ගැහැනු ළමයින් සංඛ්‍යාවට වඩා පිරිමි ළමයින් සංඛ්‍යාව වැඩි ය.

(3) පිරිමි ළමයින් සංඛ්‍යාවත් ගැහැනු ළමයින් සංඛ්‍යාවත් සමාන ය.

**35.** සමතලා බිමක නිමල්, විමල්ට මීටර 20ක් නැගෙනහිර දිශාවෙන් සිටියි. නිමල් දෙසට විමල් ගමන් අරඹන මොහොතේ ම නිමල්, විමල්ගේ වේගය මෙන් දෙගුණයක වේගයකින් නැගෙනහිර දිශාවට ම ගමන් කරයි. විමල් මීටර 10ක දුරක් නිමල් දෙසට ගමන් කළ විට දෙදෙනා අතර දුර මීටර කීය ද?


(1) 10 (2) 20 (3) 30

**36.** පහත දැක්වෙන රූපයේ සංඛ්‍යා රටාව අනුව [?] කොටුවට ගැළපෙන සංඛ්‍යාව තෝරන්න.




(1) 4 (2) 6 (3) 8


Department of Examinations - Sri Lanka

**37.** 

රූපයේ දැක්වෙන්නේ සමාන ලී කුට්ටි සමූහයක් යොදාගෙන කර ඇති ගොඩනැගීමකි. මෙම ගොඩනැගීම සඳහා යොදාගෙන ඇති මුළු ලී කුට්ටි ගණන කීය ද?

(1) 6 (2) 8 (3) 10

**38.** විවිධ ජල පරිමා සහිත සමාන භාජන තුනක් පහත දැක්වේ.





භාජන තුනේම ඇති ජල පරිමා සමාන කිරීමට අනුගමනය කළ හැකි **ඉක්මන් හා පහසු ම** ක්‍රියාමාර්ගය කුමක් ද?

(1) A භාජනයෙන් C භාජනයට ජලය දමා භාජන දෙකේම ජල පරිමා සමාන කිරීම
(2) C භාජනයේ ජල පරිමාවට සමාන වන පරිදි A හා B භාජනවලින් ජලය ඉවත් කිරීම
(3) භාජන තුනේ ම ඇති ජලය විශාල භාජනයකට දමා නැවත A, B හා C භාජන තුනට සමානව දැමීම

Department of Examinations - Sri Lanka

● පාසල් බිමක දළ සැලැස්මක් පහත දැක්වේ. ඒ ඇසුරින් අංක **39** සහ **40** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




**39.** ඉහත සැලැස්ම අනුව නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ප්‍රධාන දොරටුවට උතුරෙන් පුස්තකාලයත්, ප්‍රධාන ශාලාවට බටහිරෙන් ක්‍රීඩාපිටියත් පිහිටා ඇත.
(2) කාර්යාලයට දකුණෙන් ප්‍රධාන ශාලාවත් ප්‍රධාන ශාලාවට නැගෙනහිරෙන් පුස්තකාලයත් පිහිටා ඇත.
(3) ක්‍රීඩාපිටියට බටහිරෙන් ප්‍රධාන දොරටුවත් ආපනශාලාවට නැගෙනහිරෙන් කාර්යාලයත් පිහිටා ඇත.

**40.** මෙහි ඇති ප්‍රධාන ශාලාවේ සිට පුස්තකාලයට ගමන් කරන අයකුට ඔහුගේ දකුණු අත පැත්තෙන් පළමුවෙන් ම දැකිය හැක්කේ,

(1) ක්‍රීඩාපිටියයි. (2) ප්‍රධාන දොරටුවයි. (3) කාර්යාලයයි.

***

## පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස් වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය - 2019 අගෝස්තු

## I පත්‍රය

## උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා උපදෙස් සහ ලකුණු දීමේ පටිපාටිය

### 1. උත්තර පත්‍ර ලකුණු කිරීමේ දී සැලකිය යුතු කරුණු

1.1 සෑම ප්‍රශ්නයක ම නිවැරදි ප්‍රතිචාරයක් සඳහා "✓ " ලකුණ ද, වැරදි ප්‍රතිචාරයක් සඳහා "× " ලකුණ ද, පිටුවෙහි ප්‍රධාන කොටුවෙන් පිටත දකුණුපස තීරයෙහි පැහැදිලි ව සටහන් කරන්න.

1.2 එක් එක් පිටුවේ නිවැරදි පිළිතුරු සඳහා වූ "✓ " ලකුණුවල එකතුව එම පිටුවේ දකුණුපස පහළ කෙළවරේ ඇති **කොටුව තුළ අංක දෙකකින් සටහන් කරන්න.**

1.3 එක් එක් පිටුවේ සටහන් කළ "✓ " ලකුණුවල එකතුව මුල් පිටුවේ අදාළ පිටු අංකයට ඉදිරියෙන් ඇති කොටුව තුළ සටහන් කරන්න.

1.4 මුළු "✓ " ලකුණුවල එකතුව අවසාන ලකුණ යටතේ ඉලක්කමෙන් සහ අකුරෙන් අදාළ කොටු තුළ ලියන්න.

1.5 යම්කිසි ප්‍රශ්නයකට පිළිතුරු දී නොමැති විට වරණ තුනම යටින් රතුපාටින් ඉරක් ඇඳ වැරදි "× " ලකුණ යොදන්න.

### 2. ලකුණු ලැයිස්තු සකස් කිරීමේ දී සැලකිය යුතු කරුණු

2.1 ලකුණු ලැයිස්තුවේ "Total marks" තීරුව ලකුණු ඇතුළත් කිරීම සඳහා භාවිත කරන්න.

2.2 එම තීරුවේ එක් එක් අපේක්ෂකයාගේ විභාග අංකය ඉදිරියේ, ඊට නියමිත උත්තර පත්‍රයේ සඳහන් අවසාන ලකුණ සටහන් කරන්න.

2.3 අවසාන ලකුණ ඉදිරියෙන් තීරු දෙකක් ඉතිරි කර, එය අකුරෙන් පැහැදිලි ව ලියන්න.

2.4 ලකුණු ලැයිස්තුව සකස් කිරීමේ දී යම් වරදක් සිදුවුවහොත්, එය පැහැදිලි ව **තනි ඉරකින් කපා** ඊළඟ තීරයේ නැවත ලියා ලකුණු ඇතුළත් කළ හා පරීක්ෂා කළ පරීක්ෂකවරුන් දෙදෙනාගේ කෙටි අත්සන් යොදන්න.

2.5 කිසියම් සංශෝධනයක් කරනු ලැබුවහොත්, පළමු වන හා දෙවන පරීක්ෂකවරුන්ගේ කෙටි අත්සන් යොදා එය සනාථ කරන්න.

2.6 සංශෝධනයක් කරනු ලබන සෑම අවස්ථාවක දීම ලකුණු ලැයිස්තුවත් පිළිතුරු පත්‍රයත් ප්‍රධාන පරීක්ෂකට පෙන්වා ඔහුගේ/ඇයගේ අත්සන ද ලබා ගන්න.





2.7 සෑම සංශෝධනයක් ම, ලකුණු ලැයිස්තුවේ පසුපිටෙහි "වෙනත් කරුණු" සඳහා වෙන් ව ඇති ස්ථානයේ ද සටහන් කර පරීක්ෂකවරුන් දෙදෙනාගේ ම සම්පූර්ණ අත්සන් යොදන්න.

2.8 සෑම ලකුණු ලැයිස්තුවක් ම ප්‍රධාන පරීක්ෂක, ලකුණු ඇතුළත් කළ, පරීක්ෂා කළ සහ ඇගයීම් ලකුණු තහවුරු කළ පරීක්ෂක (EMF) විසින් ස්වකීය සංකේත අංක සහ අත්සන් යොදා සහතික කර තිබීම අනිවාර්ය වේ.

Department of Examinations - Sri Lanka

**විශේෂ උපදෙස් :-** ප්‍රශ්නවල නිවැරදි පිළිතුරුට හිමි අංකය හෝ පිළිතුරේ කොටසක් හෝ යටින් ඉරක් ඇඳ හෝ රවුම් කර හෝ සලකුණු කර ඇති විට එය නිවැරදි පිළිතුරක් ලෙස සලකන්න.පිළිතුර ලියා තිබීම නිවැරදි සේ නොසැලකේ.

## I පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | පිළිතුර |
|---|---|---|
| 1. | (3) |  |
| 2. | (2) |  |
| 3. | (3) | 3 |
| 4. | (2) | හතරකි |
| 5. | (2) |  |
| 6. | (1) |  |
| 7. | (1) | විභාග අංකය ස්ථාන දෙකක ලිවිය යුතු අතර පිළිතුරු සැපයීමට ලබාදෙන කාලය පැයකට අඩු ය. |
| 8. | (3) |   |
| 9. | (1) | පොත් කියවීමේ අගය පිළිබඳව ය. |
| 10. | (3) | පොත් කියවීම ⟶ අලුත් දැනුම ලබා ගැනීම ⟶ අලුත් අලුත් දේ නිර්මාණය කිරීම |
| 11. | (2) | සෙවනැල්ල ගැන ය. |
| 12. | (3) |   |
| 13. | (2) | C |
| 14. | (1) | H |
| 15. | (1) |  |
| 16. | (2) | ☆ ☆ ✱ |
| 17. | (1) |  |

Department of Examinations - Sri Lanka

| | | |
|---|---|---|
| 18. | (3) |  |
| 19. | (1) |  |
| 20. | (2) | 13 |
| 21. | (3) | 9 |
| 22. | (3) | 6 |
| 23. | (1) | බදාදා ය. |
| 24. | (1) |  |
| 25. | (3) | 10 |
| 26. | (2) | ධනපාල, ඥානපාල, දිනපාල |
| 27. | (2) |  |
| 28. | (1) | 6 |
| 29. | (2) | දෙවන |
| 30. | (2) | බාල දියණිය වේ. |
| 31. | (1) | හාවා ය. |
| 32. | (2) | දොර වසයි ⟶ අගුල දමයි ⟶ නින්දට යයි |
| 33. | (2) | අඹ / පේර / රඹුටන් / පොල් |
| 34. | (3) | පිරිමි ළමයින් සංඛ්‍යාවත් ගැහැනු ළමයින් සංඛ්‍යාවත් සමාන ය. |
| 35. | (3) | 30 |
| 36. | (2) | 6 |
| 37. | (3) | 10 |
| 38. | (1) | A භාජනයෙන් C භාජනයට ජලය දමා භාජන දෙකේම ජල පරිමා සමාන කිරීම |
| 39. | (2) | කාර්යාලයට දකුණෙන් ප්‍රධාන ශාලාවත් ප්‍රධාන ශාලාවට නැගෙනහිරෙන් පුස්තකාලයත් පිහිටා ඇත. |
| 40. | (1) | ක්‍රීඩාපිටියයි. |

Department of Examinations - Sri Lanka

267704

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

5

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, AUGUST 2019

# පාසල්වලට සිසුන් තෝරාගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2019 අගෝස්තු

## II පත්‍රය

**පැය 1 යි මිනිත්තු 15 යි.**

**විභාග අංකය :** ...............................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:**

* ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
* **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60 ක් ඇත. සමහර ප්‍රශ්නවල අනුකොටස් ද ඇත.
* **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* පිළිතුරු ලියන ලෙස උපදෙස් දී ඇති ප්‍රශ්නවලට **තිත් ඉරි මත** පිළිතුරු ලියන්න.
* පිළිතුරට යටින් ඉරක් අඳින්න යැයි උපදෙස් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.**
* කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමුවන පරීක්ෂක** ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම කළ බව සහතික කරමි. | V/II/S |
| **දෙවන පරීක්ෂක** පළමුවන පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි. | V/II/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක** ඇගයීම කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/II/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක** අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය. | V/II/S/CH |

[දෙවැනි පිටුව බලන්න.

**1.** පහත දැක්වෙන ඡේදය කියවන්න.

වනය පුරා පවතින නිහැඬියාව සියොතුන්ගේ නාදයෙන් බිඳී යයි. ඔබ මොබ හැසිරෙන මොනරුන්ගෙන් වනය වර්ණවත් වී ඇත. ඇඬි විමසිලිමත් බවකින් ගැවසෙන මුව රංචුවක් වැව් ඉවුරේ දිය බොමින් සිටිනු පෙනෙයි. ගස්වැල් පිරුණු පරිසරය සිප එන මඳ නල නිසා ගතට දැනෙන්නේ සිසිලකි.

● **ඡේදය ඇසුරෙන් පමණක් පිළිතුරු සපයන්න.**

(i) වනය වර්ණවත් කරන්නේ කවුරුන් ද? ....................................

(ii) යුගල පදයක් ලියන්න. ..............................................

(iii) 'සුළඟ' යන්නට සමාන පදය ලියන්න. ...............................................

(iv) වනය පුරා පවතින නිහැඬියාව බිඳෙන්නේ කුමක් හේතුවෙන් ද?

.................................................................................................................

(v) දිය බොමින් සිටින මුවන්ගේ ස්වභාවය විස්තර කර ඇත්තේ කෙසේ ද?

.................................................................................................................

(vi) ඡේදයට වඩාත් ම සුදුසු මාතෘකාව තෝරා යටින් ඉරක් අඳින්න.

(අ) වනයේ සිසිලස

(ආ) වනයේ සුන්දරත්වය

(ඉ) වනයේ සතුන්

**2.** ප්‍රාණවාචී ඒකවචන ස්ත්‍රී ලිංග නාම පදය තෝරා යටින් ඉරක් අඳින්න.

මිනිසා ළමයි කාන්තාවෝ සිංහයා ඇතින්න

**3.** දී ඇති වචන ගළපා අර්ථවත් වාක්‍යයක් ලියන්න.

දිගේ / පැළෑටිවල / නියර / මල් / තිබේ / පිපී / ඇති

.................................................................................................................

**4.** පහත සඳහන් එක් එක් වගන්තිවල උක්ත ආඛ්‍යාත සම්බන්ධය **නිවැරදි** නම් '✓' ලකුණ ද **වැරදි** නම් '**x**' ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

(i) පාසලේ එළි දක්වන සඟරාවට සිසුහු ලිපි සැපයූහ. (.........)

(ii) ඇතැමෙක් පුවත්පත් බලයි. (.........)

(iii) බොහෝ දෙනා ඈත රැකියාවලට යති. (.........)

(iv) තද සුළඟින් ගස්වැල් ඇඹරෙන්නට විය. (.........)

**5.** ගැළපෙන විරාම ලකුණු යොදන්න.

(i) ඔබ එන්නේ කොහි සිට ද

(ii) අනේ අනේ ඔහොම වැරදි වැඩ කරන්න හොඳ නැහැ

**6.** පහත සඳහන් අවස්ථාවලට ගැළපෙන ප්‍රස්ථාව පිරුළු තිත් ඉරි මත ලියන්න.

(i) කරදරයකට පත් වූ කෙනෙක් ඊටත් වඩා වැඩි තවත් කරදරයකට පත් වීම

.................................................................................................................

(ii) උදව් කළ අය අමතක කර වෙනත් අයට ප්‍රශංසා කිරීම

.................................................................................................................

[තුන්වැනි පිටුව බලන්න.

Department of Examinations - Sri Lanka

විභාග අංකය :..............................

**7.** පහත සඳහන් වැකි ලේඛන වහරට හරවා ලියන්න.

(i) ගොවියෝ කමතේ ගස් සෙවනේ ඉඳ ගත්තා.

..........................................................................................................

(ii) ගුරුතුමා මට තෑග්ගක් දුන්නා.

..........................................................................................................

**8.** නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරා හිස්තැනෙහි ලියන්න.

(i) තරිඳු උදෑසන ම පාසලට .......................... ( පැමිණියේ ය. / පැමිනියේ ය. )

(ii) අපි ගල් ගුහාවේ සිට .......................... ( තොටුපොල / තොටුපොළ ) තෙක් අඩි පාරක් තැනුවෙමු.

**9.** පහත සඳහන් වාක්‍ය අතීත කාලයට හරවා ලියන්න.

හසිතා තාලයට නටයි.

..........................................................................................................

**10.** විරුද්ධ පදය ලියන්න.

ආත්මාර්ථකාමී : ....................................

**11.** එක් එක් ඉංග්‍රීසි වචනය සඳහා යෙදෙන **සිංහල** වචනය බැගින් ලියන්න.

(i) Hospital : ....................................   (ii) Face : ....................................

**12.** එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය, **ඉංග්‍රීසි** අකුරෙන් ම ලියන්න.

(i) 

....................................

(ii) 

....................................

**13.** පහත දී ඇති වචන නිවැරදි ව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

(i) This / car / is / small / a : ..........................................................................

(ii) are / They / fast / running / very : ..........................................................

**14.** 'කොයියා මරම්' යන දෙමළ වචන සඳහා යෙදෙන **සිංහල** වචන ලියන්න.

....................................

**15.** පහත සඳහන් වාක්‍යය දෙමළෙන් කියන ආකාරය **සිංහලෙන්** ලියන්න.

අත් ඉහළට ඔසවන්න. : ..........................................................................

**16.** "විසි හය දහස් අසූ හත" සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න. : ..........................

**17.**

| | |
|---|---|
| 2 | 4 |
| 7 | 0 |

කොටුව තුළ ඇති ඉලක්කම්වලින් සෑදිය හැකි විශාල ම සංඛ්‍යාව ලියන්න.

: ..........................


Department of Examinations - Sri Lanka

[හතරවැනි පිටුව බලන්න.

**18.** පහත සංඛ්‍යාවලින් 7 ඉලක්කමෙන් නිරූපිත අගය 700 වන සංඛ්‍යාව කුමක් ද?


9270, 7028, 6753, 1467 :..........................

**19.** පහත රූපයේ දැක්වෙන ලී පටියේ දිග කොපමණ ද?




: ..................... cm

**20.** පහත සෘජුකෝණාස්‍රයේ සමමිති රේඛා **දෙකක්** අඳින්න.



Department of Examinations - Sri Lanka

**21.** පලතුරු වෙළෙන්දකු විසින් සති හතරක් තුළ විකුණන ලද අන්නාසි පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

| සතිය | අන්නාසි ගෙඩි ගණන |
|---|---|
| පළමුවන | 1256 |
| දෙවන | 1345 |
| තුන්වන | 1842 |
| හතරවන | 2480 |

(i) පළමුවන සහ දෙවන සතිවල විකුණන ලද මුළු අන්නාසි ගෙඩි ගණන කොපමණ ද?


: ..........................

(ii) තුන්වන සතියට වඩා හතරවන සතියේ කොපමණ අන්නාසි ගෙඩි ප්‍රමාණයක් විකුණා තිබේ ද?

: ..........................

**22.** පහත රූපයේ ඇත්තේ වර්ග සෙන්ටිමීටර කොටු ජාලයකි. එහි අඳුරු කර ඇති කොටසේ වර්ගඵලය වර්ග සෙන්ටිමීටර කීය ද?

: ..........................



**23.** පස්වරු 3.30 පැය විසි හතරේ ඔරලෝසුවේ දැක්වෙන ආකාරයට ඉලක්කමෙන් ලියන්න.

: ..........................

**24.** මුං ඇට 3 kg 500 g ක්, එක් මල්ලකට 500 g බැගින් වන සේ මලු කීයකට දැමිය හැකි ද?

: ..........................

**25.** එකක මිල රුපියල් 35.00 ක් බැගින් වන අභ්‍යාස පොත් 6 ක් මිල දී ගෙන රුපියල් 500 නෝට්ටුවකින් මුදල් ගෙවූ විට ලැබෙන ඉතුරු මුදල කීය ද?

: රු. ........................

**26.** සමන් යම් ස්ථානයක සිට උතුරු දිශාවට 5 m ක් ගමන් කර ඔහුගේ වම් අත පැත්තට හැරී 5 m ක් ගමන් කළේ ය. එතැන සිට දකුණු දිශාවට 5 m ක් ගමන් කළේ නම් ඔහු සිටින්නේ ගමන ආරම්භ කළ ස්ථානයට කුමන දිශාවෙන් ද?


: ..............................

**27.** කේක් 436 ක් එක් පෙට්ටියකට හතර බැගින් පෙට්ටිවලට අසුරන ලදි. කේක් අසුරන ලද පෙට්ටි ගණන කීය ද?

: ..............................

**28.** ජලය ලීටර 12 ක් සහ මිලිලීටර 500 ක් පිරවිය හැකි ටැංකියක $\frac{1}{4}$ ක ප්‍රමාණයක් ජලය පුරවා තිබුණි. ටැංකිය සම්පූර්ණයෙන් පිරවීමට තව කොපමණ ජල ප්‍රමාණයක් අවශ්‍ය ද?

: ..............l..............ml

**29.** 


සිසුන් කණ්ඩායමක් වඩාත් ම කැමති මල් වර්ග පිළිබඳ තොරතුරු ප්‍රස්තාරයේ නිරූපණය කර ඇත.

(i) රෝස මල්වලට කැමති සිසුන් සංඛ්‍යාව පිච්ච මල්වලට කැමති සිසුන් සංඛ්‍යාවට වඩා කොපමණ වැඩි ද?

: ..............................

(ii) කණ්ඩායමේ සිටින මුළු සිසුන් සංඛ්‍යාව කීය ද?

: ..............................

● අංක **30** සිට **59** තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා **යටින් ඉරක් අඳින්න**.

**30.** බීජ මගින් පැළ ලබා ගත හැකි බෝගයකි.
(1) බතල (2) වැටකොළු (3) රාජ අල (4) මඤ්ඤොක්කා

**31.** කුඹුරුවල සිටින හානිකර කෘමීන් ගොදුරු කර ගන්නා සතෙකි.
(1) බකමූණා (2) ගොළුබෙල්ලා (3) ගැඩවිලා (4) සමනලයා

**32.** ශ්‍රී ලංකාවේ ඒකදේශික ශාකයකි.
(1) මා වේවැල් (2) තේක්ක (3) කොස් (4) කොහොඹ

**33.** ශක්තිජනක කාණ්ඩයට අයත් වන ආහාරයකි.
(1) කිරි (2) නිවිති (3) බිත්තර (4) කොස්

**34.** බිතු සිතුවම් සඳහා ප්‍රසිද්ධ ස්ථානයකි.
(1) ඉසුරුමුණිය (2) සීගිරිය (3) යාපහුව (4) ගාලු කොටුව

**35.** ගෙමැස්සා මගින් රෝග බීජ ශරීරගත වීමෙන් වැළඳෙන රෝගයකි.
(1) පාචනය (2) මහාමාරිය (3) බරවා (4) චිකුන්ගුන්යා

Department of Examinations - Sri Lanka

36. ක්ෂීරපායී කාණ්ඩයට අයත් වන සතුන් **පමණක්** ඇතුළත් පිළිතුර කුමක් ද?
   (1) කිරලා, මොනරා, ගවයා
   (2) කිඹුලා, හිවලා, අලියා
   (3) ඉබ්බා, කොටියා, වලහා
   (4) ගවයා, හිවලා, දිවියා

37. දියලුම සහ කිරිගල්පොත්ත යනු ශ්‍රී ලංකාවේ පිහිටි
   (1) ගංගාවක් සහ වනාන්තරයකි.
   (2) දිය ඇල්ලක් සහ කන්දකි.
   (3) වැවක් සහ කන්දකි.
   (4) දිය ඇල්ලක් සහ ගංගාවකි.

38. ශ්‍රී ලංකාව දූපතක් ලෙස හඳුන්වනු ලබන්නේ,
   (1) කුඩා රටක් බැවිනි.
   (2) ඉන්දියාවට ආසන්න ව පිහිටි බැවිනි.
   (3) ජලයෙන් වට වී ඇති බැවිනි.
   (4) ගංගා ජලය මුහුදට ගලා යන බැවිනි.

39. "දිය නෑමට අනාරක්ෂිතයි" ලෙස වැවක් අසල දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට අදාළ **නොවන** කරුණක් වන්නේ කුමක් ද?
   (1) ජලය බීමට ගැනීම
   (2) ගැඹුරු ස්ථානයක් වීම
   (3) කිඹුලන් සිටීම
   (4) මඩ සහිත වීම

40. ඇම්බැක්කේ දේවාලය ප්‍රසිද්ධ වී ඇත්තේ,
   (1) ප්‍රතිමා නිසා ය.
   (2) ගල් කැටයම් නිසා ය.
   (3) බිතු සිතුවම් නිසා ය.
   (4) ලී කැටයම් නිසා ය.

41. අයිස් කැටයක් ජලයට දැමූ විට සිදු **නොවන්නේ** කුමක් ද?
   (1) අයිස් කැටය ජලයේ දිය වීමයි.
   (2) අයිස් කැටය ජලයේ පාවීමයි.
   (3) ජලයෙහි වර්ණය වෙනස් වීමයි.
   (4) ජලය සීතල වීමයි.

42. කොන්ඩිස් කුඩු ජලයට එකතු කළ විට ලැබෙන දියරයේ පාට කුමක් ද?
   (1) රතු (2) කහ (3) දම් (4) කොළ

43. ශාකයක ප්‍රධාන වශයෙන් ආහාර නිෂ්පාදනය කරනු ලබන්නේ පහත සඳහන් කුමන කොටස තුළ ද?
   (1) මල් (2) ගෙඩි (3) මුල් (4) පත්‍ර

44. වේළීමෙන් හා වැලි යට තැබීමෙන් කල් තබා ගත හැකි ආහාරයක් වන්නේ
   (1) දෙහි ය. (2) බිලිං ය. (3) සියඹලා ය. (4) ගොරකා ය.

45. ක්ෂීරපායී සත්ත්වයකු හඳුනාගත හැකි ලක්ෂණයක් වන්නේ,
   (1) ශාක ද්‍රව්‍ය පමණක් ආහාරයට ගැනීමයි.
   (2) මව්කිරිවලින් පැටවුන් පෝෂණය කිරීමයි.
   (3) බිත්තරවලින් පැටවුන් බිහි වීමයි.
   (4) ගොඩබිම පමණක් දක්නට ලැබීමයි.

46. වීල්බැරෝවෙන් සහ ගිරයෙන් ඉටු කර ගන්නා කාර්යයන් වන්නේ පිළිවෙළින්
   (1) බරක් රැගෙන යාම හා බෝතල් මූඩි ඉවත් කිරීමයි.
   (2) ඇණ ගැලවීම හා බෝතල් මූඩි ඉවත් කිරීමයි.
   (3) ද්‍රව්‍ය කැබලි කිරීම හා ඇණ ගැලවීමයි.
   (4) බරක් රැගෙන යාම හා ද්‍රව්‍ය කැබලි කිරීමයි.

Department of Examinations - Sri Lanka

**47.** රූපයේ දැක්වෙන සංකේතයෙන් කියැවෙන පණිවිඩය කුමක් ද?



(1) ප්‍රවේශමෙන් අල්ලන්න.
(2) බිඳෙන සුළුයි.
(3) උඩකින් තබන්න.
(4) කැඩී ඇත.

**48.** වගා ආරක්ෂා වීම සඳහා සිදුවන ස්වාභාවික ක්‍රියාවක් වන්නේ කුමක් ද?
(1) බෝග වගාව වටා ඉනි වැටක් බැඳීම
(2) පිටි මකුණන් සඳහා සබන් වතුර යෙදීම
(3) ඇටිකුකුළන් විසින් ගොළුබෙල්ලන් ආහාරයට ගැනීම
(4) කොහොඹ ඇට තලා සාදාගත් දියර ඉසීම

**49.** රාජ්‍ය ලාංඡනයේ ඇති සංකේතවලට අයත් **නොවන්නේ**
(1) ධර්මචක්‍රය ය. (2) පුන් කලස ය. (3) පලා පෙති ය. (4) පොල් මල් ය.

**50.** ශාකයක තිබෙන පත්‍ර යොදා ගනිමින් කුඩු සාදා ගන්නා සතෙකි.
(1) ලේනා (2) දිමියා (3) කපුටා (4) වඩු කුරුල්ලා

**51.** කුස්සියේ භාවිත **නොකරන** උපකරණයකි.
(1) පිහිය (2) හිරමණය (3) දැකැත්ත (4) වංගෙඩිය

**52.** සවන්දීමෙන් පමණක් තොරතුරු ලබා ගත හැකි සන්නිවේදන මාධ්‍ය දෙකක් වන්නේ
(1) රූපවාහිනිය සහ පුවත්පතයි.
(2) ගුවන් විදුලිය සහ ශබ්දවාහිනියයි.
(3) පුවත්පත් සහ ශබ්දවාහිනියයි.
(4) ගුවන් විදුලිය සහ රූපවාහිනියයි.

**53.**



ඉහත රූපයෙන් දැක්වෙන උපකරණය භාවිත කිරීම **වඩාත්** සුදුසු වන්නේ
(1) යකඩ ඇණයක් ගැසීමට ය.
(2) ඉස්කුරුප්පු ඇණයක් ගැලවීමට ය.
(3) තහඩුවක් කපා ගැනීමට ය.
(4) තහඩුවක් සිදුරු කිරීමට ය.


**54.** ශාකවලින් ලබා ගන්නා ආහාරය කුමක් ද?
(1) බටර් (2) සෝයා කිරි (3) යෝගට් (4) මුදවපු කිරි

**55.** පන්ති කාමරය තුළ කණ්ඩායම් වැඩ කිරීමේදී සිසුවකු තුළ තිබිය යුතු යහපත් ගුණාංගයක් වන්නේ
(1) අවසානය තෙක් කාර්යයෙහි නිරත වීම ය.
(2) අන් අයට පෙර තම කාර්යය නිම කිරීම ය.
(3) තමන්ගේ අදහස්වලට අනුව පමණක් කාර්යය කිරීම ය.
(4) තම කාර්යය කෙරෙහි පමණක් අවධානය යොමු කිරීම ය.

Department of Examinations - Sri Lanka

**56.** රූපයේ දැක්වෙන මැස්ම කුමක් ද?

(1) නැටි මැස්ම
(2) දම්වැල් මැස්ස
(3) බ්ලැන්කට් මැස්ම
(4) පිස්මේන්තු මැස්ම



**57.** ශ්‍රී ලංකාවේ ජන ක්‍රීඩාවක් වන්නේ පහත සඳහන් කුමන ක්‍රීඩාව ද?

(1) අත් පන්දු  (2) කැරම්  (3) චක්ගුඩු  (4) දැල් පන්දු

**58.** පසේ ඇති ද්‍රව්‍ය නිරීක්ෂණය සඳහා වඩාත් උචිත උපකරණය කුමක් ද?


(1) සිදුරු කැමරාව  (2) මාලිමාව  (3) අත් කාචය  (4) දුරදක්නය

**59.** ගෙවතු වගාවේදී භාවිත කරනු ලබන උපකරණය දැක්වෙන රූපය කුමක් ද?


(1)


(2)


(3)


(4)

**60.** "යාළුවා කළ උදව්ව මට තාම මතකයි." යන්න මාතෘකාව කරගනිමින් වාක්‍ය **තුනක්** ලියන්න.
(සෑම වාක්‍යයක් ම වචන පහකට නොඅඩු විය යුතුයි. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුයි.)

1. ..............................................................................................................

..............................................................................................................

2. ..............................................................................................................

..............................................................................................................

3. ..............................................................................................................

..............................................................................................................

* * *

Department of Examinations - Sri Lanka

# පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස් වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය - 2019 අගෝස්තු

## II පත්‍රය

## උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා උපදෙස් සහ ලකුණු දීමේ පටිපාටිය

### 1. උත්තර පත්‍ර ලකුණු කිරීමේ දී සැලකිය යුතු කරුණු

1.1 සෑම ප්‍රශ්නයක ම නිවැරැදි ප්‍රතිචාරයක් සඳහා "✓" ලකුණ ද එයට හිමි ලකුණු ප්‍රමාණය ද වැරදි ප්‍රතිචාරයක් සඳහා "×" ලකුණ ද 00 ද පිටුවෙහි දකුණුපස තීරයෙහි පැහැදිලි ව සටහන් කරන්න.

1.2 එක් එක් පිටුවේ නිවැරැදි පිළිතුරු සඳහා වූ ලකුණුවල එකතුව එම පිටුවේ දකුණුපස පහළ කෙළවරේ ඇති **කොටුව තුළ අංක දෙකකින් සටහන් කරන්න.**

1.3 එක් එක් පිටුවේ සටහන් කළ ලකුණුවල එකතුව මුල් පිටුවේ අදාළ පිටු අංකයට ඉදිරියෙන් ඇති කොටුව තුළ සටහන් කරන්න.

1.4 සමස්ත උත්තර පත්‍රය සලකා බලා අත්අකුරු සහ ඉලක්කම් පැහැදිලි ව සහ නිවැරැදි ව ලියා ඇත්නම් අමතර ලකුණු දෙකක් ප්‍රදානය කරන්න. එසේ ම අත්අකුරු අපැහැදිලි තත්ත්වයකින් තිබුණත් නිවැරැදි ව ලියා ඇත්නම් ලකුණු 01 ක් ප්‍රදානය කරන්න. එම ලකුණු + 02 හෝ + 01 ලෙස පළමු වන පිටුවේත් අට වන පිටුවේත් ලකුණු තීරුවේ සටහන් කරන්න. ලකුණු නොදෙන්නේ නම් ලකුණු + 00 ලෙස සටහන් කරන්න.

1.5 සියලු ම ලකුණුවල එකතුව අවසාන ලකුණ යටතේ ඉලක්කමෙන් සහ අකුරෙන් අදාළ කොටු තුළ ලියන්න.

Department of Examinations - Sri Lanka

### 2. ලකුණු පටිපාටිය පිළිබඳ කෙටි විස්තරයක්

2.1 ප්‍රශ්න අංක 1 සිට 15 තෙක් ප්‍රශ්නවල සියලු ම කොටස්වල නිවැරදි පිළිතුරු සඳහා ලකුණු 01 බැගින් ප්‍රදානය කරන්න.

2.2 ප්‍රශ්න අංක 16 සිට 29 තෙක් ප්‍රශ්නවල සියලුම නිවැරැදි පිළිතුරු සඳහා ලකුණු 02 බැගින් ප්‍රදානය කරන්න.

2.3 ප්‍රශ්න අංක 30 සිට 59 තෙක් නිවැරැදි පිළිතුර සඳහා ලකුණු 01 බැගින් ප්‍රදානය කරන්න

2.4 ප්‍රශ්න අංක 60 සඳහා (වගන්ති) එක් වගන්තියකට ලකුණු 02 බැගින් ප්‍රදානය කරන්න.

2.5 ප්‍රශ්න අංක 1, 3, 6, 7, 8, 9, 10 පිළිතුරුවල අක්ෂර වින්‍යාසය නිවැරැදි ව තිබිය යුතුයි.

2 6 ප්‍රශ්න අංක 08 (i) (ii) පිළිතුරු හිස්තැනෙහි ලියා තැබිය යුතුයි

2.7 අංක 1(VI), 2 ප්‍රශ්නවල නිවැරැදි පිළිතුරට **යටින් ඉරක් ගසා තිබිය යුතුයි.**

2.8 ප්‍රශ්න අංක 12 පිළිතුරුවල සියලු ම අකුරු නිවැරැදි විය යුතුයි. ඉංග්‍රීසි වචනවල කැපිටල් සිම්පල් මිශ්‍ර ව ලියා තිබුණ ද ලකුණු ලබා දෙන්න.

2.9 ප්‍රශ්න අංක 13 උපුටා ගැනීමක් නිසා නිවැරැදි ව ලියා තිබිය යුතු වේ.

## 3. ලකුණු ලැයිස්තු සකස් කිරීමේ දී සැලකිය යුතු කරුණු

3.1 ලකුණු ලැයිස්තුවේ "Total marks" තීරුව ලකුණු ඇතුළත් කිරීම සඳහා භාවිත කරන්න.

3.2 එම තීරුවේ එක් එක් අපේක්ෂකයාගේ විභාග අංකය ඉදිරියේ, ඊට නියමිත උත්තර පත්‍රයේ සඳහන් අවසාන ලකුණ සටහන් කරන්න.

3.3 අවසාන ලකුණ ඉදිරියෙන් තීරු දෙකක් ඉතිරි කර, එය අකුරෙන් පැහැදිලි ව ලියන්න.

3.4 ලකුණු ලැයිස්තුව සකස් කිරීමේ දී යම් වරදක් සිදු වුවහොත්, එය පැහැදිලි ව **තනි ඉරකින් කපා** නැවත ලියා ලකුණු ඇතුළත් කළ හා පරීක්ෂා කළ පරීක්ෂකවරුන් දෙදෙනාගේ කෙටි අත්සන් යොදන්න.

3.5 කිසියම් සංශෝධනයක් කරනු ලැබුවහොත්, පළමු වන හා දෙවන පරීක්ෂකවරුන්ගේ කෙටි අත්සන් යොදා එය සනාථ කරන්න.

3.6 සංශෝධනයක් කරනු ලබන සෑම අවස්ථාවක දී ම ලකුණු ලැයිස්තුවත් පිළිතුරු පත්‍රයත් ප්‍රධාන පරීක්ෂකට පෙන්වා ඔහුගේ/ඇයගේ අත්සන ද ලබා ගන්න.

3.7 සෑම සංශෝධනයක් ම, ලකුණු ලැයිස්තුවේ පසුපිටෙහි "වෙනත් කරුණු" සඳහා වෙන් ව ඇති ස්ථානයේ ද සටහන් කර පරීක්ෂකවරුන් දෙදෙනාගේ ම සම්පූර්ණ අත්සන් යොදන්න.

3.8 සෑම ලකුණු ලැයිස්තුවක් ම ප්‍රධාන පරීක්ෂක, ලකුණු ඇතුළත් කළ, පරීක්ෂා කළ සහ ඇගයීම් ලකුණු තහවුරු කළ පරීක්ෂක (EMF) විසින් ස්වකීය සංකේත අංක සහ අත්සන් යොදා සහතික කර තිබීම අනිවාර්ය වේ.

Department of Examinations - Sri Lanka

**පිළිතුරු පත් ලකුණු කිරීමේ දීත් ලකුණු ලැයිස්තු පිළියෙල කිරීමේ දීත් පිරිසිදු ව, පැහැදිලි ලෙස, සම්මත ආකාරයට කටයුතු කිරීමට සැලකිලිමත් විය යුතු ය.**


**උත්තර පත්‍රයක හෝ ලකුණු ලැයිස්තුවක හෝ යම් වෙනසක් සිදු කරන්නේ නම් එය පළමු පරීක්ෂක විසින් ම සිදු කළ යුතු ය. නමුත් ඒ සියල්ල ප්‍රධාන පරීක්ෂකගේ අනුමැතිය ඇති ව කළ බවට ප්‍රධාන පරීක්ෂකගේ අත්සන ද යෙදිය යුතු අතර ගණිත පරීක්ෂක හා උත්තර පත්‍රය පරීක්ෂා කළ දෙවන පරීක්ෂකගේ ද කෙටි අත්සන යෙදිය යුතු ය.**

# II පත්‍රය

## ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රශ්න අංකය | පිළිතුරු | ලකුණු |
|---|---|---|
| 1. | (i) මොනරු/මොනරුන්/ඔබ මොබ හැසිරෙන මොනරු/ ඔබ මොබ හැසිරෙන මොනරුන්<br>(ii) ඔබ මොබ<br>(iii) නල<br>(iv) සියොතුන්ගේ නාදයෙන්/සියොතුන්ගේ නාදයෙනි/සියොතුන්ගේ නාදය නිසා/සියොතුන්ගේ නාදය හේතුවෙන්/සියොතුන්ගේ නාදය හේතුවෙනි.<br>(v) දැඩි විමසිලිමත් බවකින්<br>(vi) (ආ) වනයේ සුන්දරත්වය | 1<br>1<br>1<br>1<br>1<br>1 |
| 2. | ඇතින්න | 1 |
| 3. | නියර දිගේ ඇති පැළෑටිවල මල් පිපී තිබේ. | 1 |
| 4. | (i) ✓<br>(ii) ×<br>(iii) ✓<br>(iv) ✓ | 1<br>1<br>1<br>1 |
| 5. | (i) ඔබ එන්නේ කොහි සිට ද?<br>(ii) අනේ ! අනේ ! ඔහොම වැරදි වැඩ කරන්න හොඳ නැහැ. | 1<br>1 |
| 6. | (i) කබලෙන් ලිපට/ළිපට වැටුණා වගේ/වාගේ/වගෙයි/ගහෙන් වැටුණු මිනිහට ගොනා ඇන්නා වගේ<br>(ii) ගඟෙන් දිය බී මුහුදට ආවඩන්නා සේ/අවඩන්නා සේ | 1<br>1 |
| 7. | (i) ගොවියෝ කමතේ ගස් සෙවනේ ඉඳ ගත්හ./ඉඳ ගත්තෝ ය./ ගත්තෝය.<br>ගොවියෝ කමතේ ගස් සෙවණේ ඉඳ ගත්හ./ඉඳ ගත්තෝය./ ගත්තෝ ය.<br>(ii) ගුරුතුමා මට තෑග්ගක් දුන්නේ ය./දුන්නේය. | 1<br>1 |
| 8. | (i) පැමිණියේ ය/පැමිණියේය.<br>(ii) තොටුපොළ | 1<br>1 |
| 9. | හසිතා තාලයට නැටුවා ය./නැටුවාය. | 1 |
| 10. | පරාර්ථකාමී | 1 |
| 11. | (i) රෝහල/ආරෝග්‍ය ශාලාව/ඉස්පිරිතාලය<br>(ii) මුහුණ/මූණ/වත/මුව..... | 1<br>1 |
| 12. | (i) Train / TRAIN / train<br>(ii) Ice Cream / ICE CREAM | 1<br>1 |
| 13. | (i) This is a small car<br>(ii) They are running very fast | 1<br>1 |

Department of Examinations - Sri Lanka

| ප්‍රශ්න අංකය | පිළිතුරු | ලකුණු |
|---|---|---|
| 14. | පේර ගස | 1 |
| 15. | කෙහෙල්ලෙළ මේළේ උයර්ත්තුංගල් | 1 |
| 16. | 26087 / 26 087 | 2 |
| 17. | 7420 / 7 420 | 2 |
| 18. | 6753 / 6 753 | 2 |
| 19. | 7 | 2 |
| 20. |  කඩ ඉරිවලින් ලකුණු කර තිබුණ ද නිවැරදි ය. සෘජුකෝණාස්‍රයෙන් පිටතට යන ලෙස ඇඳ තිබුණ ද නිවැරදි ය. එක් රේඛාවක් පමණක් නිවැරදි නම් ලකුණු 1ක් ප්‍රදානය කරන්න. | 2 |
| 21. | (i) 2601 / 2 601<br>(ii) 638 | 2<br>2 |
| 22. | 10 / වර්ග සෙන්ටිමීටර 10/ 10cm$^2$ | 2 |
| 23. | 15 : 30/ පැය 15 : 30 | 2 |
| 24. | 7 / හත | 2 |
| 25. | 290.00 / 290/= / 290 | 2 |
| 26. | බස්නාහිර / බටහිර | 2 |
| 27. | 109 | 2 |
| 28. | 9 l 375 ml | 2 |
| 29. | (i) 3<br>(ii) 40 | 2<br>2 |
| 30. | (2) වැටකොළු | 1 |
| 31. | (1) බකමූණා | 1 |
| 32. | (1) මා වේවැල් | 1 |
| 33. | (4) කොස් | 1 |
| 34. | (2) සීගිරිය | 1 |

Department of Examinations - Sri Lanka

| ප්‍රශ්න අංකය | පිළිතුරු | ලකුණු |
|---|---|---|
| 35. | (1) පාචනය | 1 |
| 36. | (4) ගවයා,හිවලා,දිවියා | 1 |
| 37. | (2) දියඇල්ලක් සහ කන්දක් | 1 |
| 38. | (3) ජලයෙන් වට වී ඇති බැවිනි. | 1 |
| 39. | (1) ජලය බීමට ගැනීම | 1 |
| 40. | (4) ලී කැටයම් නිසා ය. | 1 |
| 41. | (3) ජලයෙහි වර්ණය වෙනස් වීමයි. | 1 |
| 42. | (3) දම් | 1 |
| 43. | (4) පත්‍ර | 1 |
| 44. | (1) දෙහි | 1 |
| 45. | (2) මව්කිරිවලින් පැටවුන් පෝෂණය කිරීමයි. | 1 |
| 46. | (4) බරක් රැගෙන යාම හා ද්‍රව්‍ය කැබලි කිරීමයි. | 1 |
| 47. | (2) බිඳෙන සුළුයි. | 1 |
| 48. | (3) ඇටිකුකුළන් විසින් ගොළුබෙල්ලන් ආහාරයට ගැනීම. | 1 |
| 49. | (4) පොල් මල් ය. | 1 |
| 50. | (2) දිමියා | 1 |
| 51. | (3) දැකැත්ත | 1 |
| 52. | (2) ගුවන් විදුලිය හා ශබ්දවාහිනියයි. | 1 |
| 53. | (2) ඉස්කුරුප්පු ඇණයක් ගැලවීමට ය. | 1 |
| 54. | (2) සෝයා කිරි | 1 |
| 55. | (1) අවසානය තෙක් කාර්යයෙහි නිරත වීම ය. | 1 |
| 56. | (3) බ්ලැන්කට් මැස්ම | 1 |
| 57. | (3) චක්ගුඩු | 1 |
| 58. | (3) අත් කාචය | 1 |

Department of Examinations - Sri Lanka

| ප්‍රශ්න අංකය | පිළිතුරු | ලකුණු |
|---|---|---|
| 59. | (3)  | 1 |
| 60. | **නිවැරදි වාක්‍ය 03**<br><br>**වගන්ති සඳහා උපදෙස්**<br>(i) සෑම වාක්‍යයක් ම වචන පහකට (05) නොඅඩු විය යුතු ය.<br>(ii) උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි විය යුතු ය.<br>(iii) අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.<br>(iv) මාතෘකාවට අදාළ විය යුතු ය.<br>(v) ලිඛිත භාෂාවෙන් ලියන ලද වැකි විය යුතු ය.<br>(vi) වැකියේ අදහස නිවැරදි විය යුතු ය.<br>(vii) එක ම අදහස නැවත නැවත ලිවීම සිදු නොවිය යුතු ය.<br>(viii) මාතෘකාව නැවත සඳහන් කිරීම අපේක්ෂා නොකෙරේ.<br>(ix) සිදුවීම් එකක් විය යුතු ය.<br>(x) සිදු වූ සිද්ධිය අතීත කාලයේ සිදුවීමක් විය යුතු ය.<br>(xi) මාතෘකාවේ වචන වාක්‍යවල තිබිය යුතු ම නැත.<br>(xii) කරන ලද උදව්ව වාක්‍ය තුනෙහි කොතැනක හෝ තිබිය හැකි ය.<br>(xiii) යාළුවා / යහළුවා යනු පොදු නාමයකි. යහළුවා හෝ යෙහෙළිය උක්ත විය හැකිය. (ආඛ්‍යාතය ඊට ගැලපිය යුතු ය.)<br>(xiv) මාතෘකාව ම නැවත ලියා ඇත්නම් ලකුණු ලබා නොදේ.<br>(xv) තමන්ට නොව තවත් කෙනෙකුට කරන ලද උදව්වක් වුව ද නිවැරදි ය.(පුද්ගලයෙකුට/සතෙකුට)<br><br>**වැකියකට එක් ලකුණක් පමණක් ප්‍රදානය කිරීම පිළිබඳ ව උපදෙස්**<br>වැකියේ එක් වචනයක අකුරක අඩුපාඩුවක් හෝ පිල්ලමක අඩුවක් හෝ වේ නම් ලකුණු 01 කි.<br>(එකට වැඩි අඩුපාඩු වේ නම් ලකුණු නොලැබේ.) | 2×3=6 |

Department of Examinations – Sri Lanka

| | | | |
|---|---|---|---|
| 1 | ——— | 15 | ලකුණු 30 |
| 16 | ——— | 29 | ලකුණු 32 |
| 30 | ——— | 59 | ලකුණු 30 |
| 60 | ——— | | ලකුණු 06 |
| | | අතිරේක ලකුණු | 02 |
| | | මුළු ලකුණු | 100 |